# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2248/10 - 2021 ඔක්තෝබර් මස 04 වැනි සඳුදා - 2021.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව, අංක 2131/60 හා 2019.07.13 දිනැති, අංක 2074/45 හා 2018.06.08 දිනැති සහ අංක 2043/13 හා 2017.10.30 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදන* මගින් සංශෝධනය කරන ලද, අංක 2014/3 හා 2017.04.11 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයේ* සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද බලතල පැවරීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ. මෙම සංශෝධනය 2021.08.03 වැනි දින සිට බලාත්මක වේ.

"අ" උපලේඛනය

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 වන ශ්‍රේණියට අයත් හා ඊට ඉහළ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | දැනට පවරා ඇති බලතලවලට අමතරව පහත සඳහන් බලතල පැවරීමට<br><br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ස්ථාන මාරු පටිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 223 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම. |


1A G - 35034 - 25 (2021/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 2. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 වන ශ්‍රේණියට පහළ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්/අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු | දැනට පවරා ඇති බලතලවලට අමතරව පහත සඳහන් බලතල පැවරීමට<br><br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ස්ථාන මාරු පටිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 223 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම. |
| 3. අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපනය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ 1 වන ශ්‍රේණියේ හා ඊට ඉහළ නිලධරයන් (ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට අයත් නිලධරයන්ද ඇතුළුව) | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්/අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු | දැනට පවරා ඇති බලතලවලට අමතරව පහත සඳහන් බලතල පැවරීමට<br><br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ස්ථාන මාරු පටිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 223 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම. |
| 4. අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපනය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ 1 වන ශ්‍රේණියට පහළ නිලධරයන් (ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට අයත් නිලධරයන්ද ඇතුළුව) | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්/අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු | දැනට පවරා ඇති බලතලවලට අමතරව පහත සඳහන් බලතල පැවරීමට<br><br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ස්ථාන මාරු පටිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 223 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම. |
| 5. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I පන්තියේ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | දැනට පවරා ඇති බලතලවලට අමතරව පහත සඳහන් බලතල පැවරීමට<br><br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ස්ථාන මාරු පටිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 223 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම. |
| 6. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I පන්තියට පහළ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | දැනට පවතින අංක III. හි සඳහන් වගන්තිය ඉවත් කර මෙහි පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලැබේ.<br><br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 218 සිට 222 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම්. |

| *I තීරුව*<br>*නිලධාරි ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු | දැනට පවතින අංක II හි සඳහන් වගන්තිය ඉවත් කර මෙහි පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලැබේ.<br><br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ස්ථාන මාරු පටිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 223 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම.<br><br>දැනට පවරා ඇති බලතලවලට අමතරව පහත සඳහන් බලතල පැවරීමට<br><br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන සැලසීම.<br><br>IV. වැඩ බැලීමේ කාලය දීර්ඝ කිරීම. |

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම**

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව අධ්‍යාපන සේවා කමිටුව වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2014/3 හා 2017.04.11 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද බලතල පැවරීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ. මෙම සංශෝධනය 2021.08.03 වැනි දින සිට බලාත්මක වේ.

"ආ" උපලේඛනය

| *I වන තීරුව*<br>*නිලධාරි ගණය* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|
| 1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිලධරයන් | අනු අංක II යටතේ පවරා ඇති බලතල පමණක් පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට (අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී)<br><br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 218 සිට 222 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම්. |
| 2. අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ 1 වන ශ්‍රේණියේ හා ඊට ඉහළ නිලධරයන් (ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට අයත් නිලධරයන් ද ඇතුළුව) | අනු අංක II යටතේ පවරා ඇති බලතල පමණක් පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට (අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී)<br><br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 218 සිට 222 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම් |

| *I වන තීරුව*<br>*නිලධාරි ගණය* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|
| 3. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියේ නිලධරයන් | අනු අංක II යටතේ පවරා ඇති බලතල පමණක් පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට (අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී)<br><br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 218 සිට 222 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම් |

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2014/3 හා 2017.04.11 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* සහ ඊට කලින් කලට ඇතුළත් කරනු ලැබ ඇති සංශෝධනයෙන්හි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 සැප්තැම්බර් මස 29 වැනි දින,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

10 - 184

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.